# FORMS OF GOVERNMENT

# (Part IV)

# විධායක බලය සංවිධානය වීම අනුව පවත්නා ආණ්ඩුක්‍රම

මේ යටතේ ආණ්ඩුක්‍රම වර්ග තුනකට බෙදනු ලැබේ. එනම්, පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය, ජනාධිපති ආණ්ඩුක්‍රමය සහ මිශ්‍ර ආණ්ඩුක්‍රමය වශයෙනි.

## පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය

පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම නිරන්තරයෙන් ම බ්‍රිතාන්‍යය ආදර්ශයට ගනී, එම ආණ්ඩුක්‍රම පුළුල් ලෙසින් බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල දක්නට ලැබේ. එමෙන් ම බටහිර යුරෝපීය රටවලින් ද සොයා ගත හැකි ය.

ජනාධිපති ආණ්ඩුක්‍රමවල විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර පැහැදිලි බෙදීමක් පැවතුනද පාර්ලිමේන්තු ක්‍රමයෙහි මෙය පැහැදිලි ව දැකිය නොහැකි ය.

Class Work.LK

## පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ

පාර්ලිමේන්තු ක්‍රමයක, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත වන කැබිනට් මණ්ඩලයට විධායක බලය හිමිය. කැබිනට් මණ්ඩලය ''දේශපාලන විධායකය'' යනුවෙන් හැඳින්වෙන්නේ එබැවිනි.

පාර්ලිමේන්තුවේ බහුතර සහාය ලබන පක්ෂයේ හෝ සන්ධානයේ හෝ නායකයා අගමැති බවට පත් වේ.

අගමැතිවරයා විසින් සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ සාමාජිකයන් අතුරෙන් තෝරාගන්නා අයගෙන් කැබිනට් මණ්ඩලය සකස් කරගනී. කැබිනට් මණ්ඩලය ආණ්ඩුවේ නාභිය බවට පත් වේ.

පාර්ලිමේන්තුවේ සහාය මත ආණ්ඩුව රඳා පවතී. මෙයින් අදහස් වන්නේ පාර්ලිමේන්තු ක්‍රමයක විධායකය සෘජු ලෙසින්ම ව්‍යවස්ථාදායකය මත රඳා පවතින් බවත් ව්‍යවස්ථාදායකයට වගකියන බවත් ය.

ClassWork.LK

රාජ්‍ය නායකයා සෘජු ලෙසින් ම තෝරාපත් කර ගැනීමක් සිදු නොවේ. රාජ්‍ය නායකයා එක්කෝ රජ කෙනෙකු හෝ එසේත් නැතිනම් වක්‍ර ලෙසින් තෝරාපත් කරගනු ලබන ජනාධිපතිවරයකු හෝ විය හැකි ය. බ්‍රිතාන්‍යය සහ ඉන්දියාව උදාහරණ යි.

අගමැතිවරයා සහ කැබිනට් මණ්ඩලය සාමූහික ලෙසින් පාර්ලිමේන්තුවට වගකියති.

ජනාධිපති ක්‍රමය සමඟ සසඳන විට පාර්ලිමේන්තු ක්‍රමයේ වාසි අතුරින් එකක් වන්නේ විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ සම්මිශ්‍රණයෙන් ශක්තිමත් සහ ස්ථාවර ආණ්ඩුවක් නිර්මාණය කිරීමේ හැකියාව යි. මෙය පොදුවේ ඕස්ට්‍රේලියාවේ, කැනඩාවේ, බ්‍රිතාන්‍යයේ, ඩෙන්මාර්කයේ සහ ජපානයේ දක්නට ලැබේ.

ClassWork.LK

# ජනාධිපති ආණ්ඩුක්‍රමය

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි ලෝකය තුළ ජනාධිපති ආණ්ඩුක්‍රමය පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයට එක් ප්‍රධාන විකල්පයකි. එසේ වුව ද, ජනාධිපති ආණ්ඩුක්‍රමය පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය මෙන් ලොව පුරා පැතිරුණු ආණ්ඩුක්‍රමයක් නොවේ. ඇමෙරිකානු එක්සත් ජනපදයේ ජනාධිපති ආණ්ඩුක්‍රමය ලතින් ඇමෙරිකාවේ බොහෝ රටවල ආකෘතියක් වශයෙන් යොදා ගෙන තිබේ. පිලිපීනය ඒ සම්බන්ධයෙන් ඇති ආසියාතික උදාහරණයකි.

ජනාධිපති ආණ්ඩුක්‍රම අතර කවර ආකාරයේ වෙනස්කම් පැවතිය ද එම ආණ්ඩුක්‍රමයේ පවතින අතිමූලික ගති ලක්ෂණ නම් ව්‍යවස්ථාදායකය සහ විධායකය වෙන වෙන ම තේරී පත්වීම
(separate origin) සහ එකිනෙකින් වෙන් වු පැවැත්ම (separate survival) ය. මේ අනුව,

විධායකය සහ ව්‍යවස්ථාදායකය වෙන් වෙන් ව තෝරාපත් කරගනු ලබන අතර මෙම අංශවලට ව්‍යවස්ථානුකූල ස්වාධීන බලතල හිමි වේ. මේ අනුව ජනාධිපතිවරයා සෘජු ලෙසින් ම හෝ ඇමෙරිකානු එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා තෝරාපත් කරගන්නා ආකාරයට හෝ ඡන්ද විද්‍යාලයක් මඟින් පත් කරගැනේ.

ClassWork.LK

විධායක සහ ව්‍යවස්ථාදායක අංශ අතර විධිමත් පුද්ගල බෙදීමක් පවතී. ජනාධිපතිවරයා රාජ්‍යයේ නායකයා මෙන් ම ආණ්ඩුවේ නායකයා ද වේ.

විධායකය ව්‍යවස්ථාදායකයට වග නොකියන අතර, ව්‍යවස්ථාදායකයට විශේෂිත දෝෂාභියෝග ක්‍රියාවලියකින් මිස ජනාධිපතිවරයා ඉවත් කළ නොහැකි ය. අනෙක් අතට ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායකය ඉවත් කළ නොහැකි ය. මින් අදහස් වන්නේ මෙම අංශ දෙකෙහි නිළ කාලය නිශ්චිත කර ඇති බව ය.

විධායක අධිකාරිත්වය ජනාධිපතිවරයාට ලබා දී ඇති අතර කැබිනට් මණ්ඩලය ජනාධිපතිවරයාට වග කියනු ලබන හුදු උපදේශකයෝය. කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෝ ව්‍යවස්ථාදායකයේ සාමාජිකයෝ නොවෙති. ව්‍යවස්ථාදායකයේ සාමාජිකයකු කැබිනට් මණ්ඩලයට පත් කළහොත් ඔහු/ඇය ව්‍යවස්ථාදායකයෙන් ඉල්ලා අස්විය යුතු ය.

ClassWork.LK

රාජ්‍ය නායකයාගේ භූමිකාව සහ ආණ්ඩුවේ නායකයාගේ භූමිකාව ජනාධිපති නිලය වෙතට ගොනු කර ඇත.

ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ප්‍රබලතාව වනුයේ විධායක බලතලවලින් ව්‍යවස්ථාදායක බලතල වෙන් කිරීමට උත්සාහ දැරීම යි. එය සංවරණ සහ තුළන ක්‍රමය මත ගොඩ නඟා ඇත. එම තත්ත්වය පුද්ගල නිදහස සහ හිමිකම් ආරක්ෂා කිරීමට සහාය වේ. එමෙන් ම ආණ්ඩුවේ එක ආයතනයකට බලය කේන්ද්‍රගත වීමේ අවකාශය එයින් වැළැක්වේ.

ClassWork.LK

# මිශ්‍ර ආණ්ඩුක්‍රමය

විවිධ ආණ්ඩුක්‍රමවල ලක්ෂණ අන්තර්ගත ව පවතින ආණ්ඩු මිශ්‍ර ආණ්ඩුක්‍රම ලෙසින් හඳුන්වනු ලබයි. රාජාණ්ඩු සහ සමුහාණ්ඩු යන ආණ්ඩුක්‍රම ලක්ෂණ මිශ්‍ර වූ ආණ්ඩු මෙන් ම ජනාධිපති සහ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමවල ලක්ෂණවල එකතුවෙන් ගොඩ නැගුණු ආණ්ඩුක්‍රම ද පවතී.

මෙලෙස මිශ්‍ර ආණ්ඩුක්‍රම ගණනාවක් පවතින අතර ඉන් වඩාත් බහුල සහ ජනප්‍රිය මිශ්‍ර ආණ්ඩුක්‍රම ස්වරූපය වන්නේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ සහ ජනාධිපති ක්‍රමයේ මූලික අංග ලක්ෂණ සහිත අර්ධ ජනාධිපති ක්‍රමය යනුවෙන් බහුල ව හඳුන්වනු ලබන ආණ්ඩුක්‍රමය යි.

අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමය එක් අතකින් පාර්ලිමේන්තුවට උත්තර දීමට බැඳී සිටින අගමැති ඇතුළු ඇමති මණ්ඩලයකින් ද තව අතකින් ජනතාවගේ සෘජු ඡන්දයෙන් තේරීපත් වන විධායක බලතල සහිත ජනාධිපති වරයකුගෙන්ද සමන්විත වේ.

ClassWork.LK

අර්ධ ජනාධිපති ආණ්ඩු ක්‍රමයෙ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පවතී.

- ජනාධිපතිවරයා ජනතාවගේ ඡන්දයෙන් තෝරාපත් කර ගත් අයකු වීම
- ජනාධිපතිවරයාට සැලකිය යුතු විධායක බලතල පැවතීම
- විධායක බලතල සහිත අගමැතිවරයා සහ ඇමති මණ්ඩලයක් ජනාධිපතිවරයාට අභිමුඛව සිටීම සහ ඒ පිරිස පාර්ලිමේන්තුවේ බහුතර කැමැත්ත ඇති තෙක් ධුරය දැරීම

ද්විත්ව විධායක ක්‍රමය නමින් ද හැඳින්වෙන අර්ධ ජනාධිපති ක්‍රමය ප්‍රධානයන් දෙදෙනෙකු සහිත ක්‍රමයක් බැවින් එය නියත වශයෙන් ම පාලන අධිකාරිත්වයේ බෙදීමක් නිර්මාණය කරයි. එපමණක්ද නොව ප්‍රතිවිරුද්ධ පක්ෂ දෙකකට ජනාධිපති සහ ඇමති මණ්ඩලයේ බලය අයත් වන විටක මෙම බෙදීම ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර ගැටුම් ඇති වීමට ද හේතු විය හැකි ය.

ClassWork.LK

ප්‍රංශය මේ සම්බන්ධයෙන් දිය හැකි ප්‍රබල උදාහරණයකි. මීට අතිරේක ව මේ වන විට ශ්‍රී ලංකාවද ඇතුළුව බල්ගේරියාව, ලිතුවේනියාව, මැසඩෝනියාව, මැඩගස්කරය, මාලි, මොසැම්බික්, රොමේනියාව ආදි රටවල ද ක්‍රියාත්මක වන්නේ අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රම යි (Newton Deth 2005; Sodaro 2008).

ClassWork.LK

# ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රමය (Autocracy)

ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රමයක ප්‍රධාන  ලක්ෂණය වන්නේ එක් පුද්ගලයෙකු අත රාජ්‍ය බලය සංකේන්ද්‍රණයව තිබීම සහ ඒකතාන්ත්‍රිකයාගේ තීරණ බාහිර නෛතික අවරෝධක හෝ ජනතා පාලනය හෝ යන දෙකෙන් එකකට වත් ලක් නොවීම ය.

මෙම පාලන ක්‍රමය යටතේ පුද්ගල අයිතිවාසිකම් සාමාන්‍යයෙන් නොසලකා හරින අතර බලය නිරන්තරයෙන් ම පවත්වා ගෙන යනු ලබන්නේ බලහත්කාරයෙනි. මේ අනුව ඒක තාන්ත්‍රිකයාගේ අධිකාරිත්වය වළක්වන ව්‍යවස්ථාවක් හෝ කිසිදු නීතියක් හෝ මෙම පාලන ක්‍රමයෙහි නොපවතී. එමෙන් ම ජනතාවට ඔවුන්ගේ ආණ්ඩුව ක්‍රියාත්මක විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳ ව තම අදහස් ප්‍රකාශ කිරීමට මැතිවරණ වැනි ප්‍රජාතාන්ත්‍රික ක්‍රම වේද නොමැත.

Class Work.LK

ඒකතාන්ත්‍රිකවාදයේ (autocracy) ප්‍රධාන ඓතිහාසික ස්වරූපයන් වන්නේ පරම රාජාණ්ඩුක්‍රමය සහ ඒකාධිපතිවාදය යි. ඒ අතර ම, ඒක බලවාදී පාලන ක්‍රමය සහ හමුදා අණ්ඩාදායකත්වයක් සහිත පාලන ක්‍රමය ඒක තාන්ත්‍රික පාලන ක්‍රම වශයෙන් හඳුනාගත හැකි ය.

එසේ වුව ද ඒක බලවාදී (totalitarian) පාලන ක්‍රම සහ හමුදා ආඥාදායක පාලන ක්‍රම සෑම විට ම ඒක තාන්ත්‍රික පාලන ක්‍රම සමඟ එකට ගමන් කරන්නේ නැත. ඒක බලවාදී පාලන ක්‍රමයක දී (ඒක බලවාදී පාලන ක්‍රමයක් යනු ජීවිතයේ සහ සිවිල් සමාජයේ සෑම පැති කඩක් ම පාලනය කරන පාලන ක්‍රමයකි) මෙන් ම හමුදා ආඥාදායකත්වයක් සහිත පාලන ක්‍රමයක දී එක් උත්තරීතර ආඥාදායකයකු විසින් එම පාලන ක්‍රමයට නායකත්වය දීම මඟින් ඒක තාන්ත්‍රික පාලන ක්‍රමයක් නිර්මාණය කරගත හැකි ය.

අනෙක් අතට ඒක බලවාදී හෝ හමුදා ආඥාදායකත්වයක් සහිත පාලන ක්‍රම කොමියුන, ජුන්ටා හෝ තනි දේශපාලන පක්ෂයක් හෝ වැනි සාමූහික නායකත්ව ස්වරූපයකින් ක්‍රියා කළහැකි ය.

ClassWork.LK

ඇතැම් විට ඒක තන්ත්‍ර පාලන ක්‍රම ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩුක්‍රම ඔස්සේ ද මතු විය හැකිය. ඒක තන්ත්‍ර පාලන ක්‍රමයක පවතින ප්‍රධාන වාසිය වනුයේ තීරණ ගැනීම සහ තීරණ ක්‍රියාත්මක කිරීම වහා සිදු කළ හැකි වීම යි. එසේ වුවද, ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රම පජාතන්ත්‍රවාදය සම්පර්ූණයෙන්ම නිෂේධනය කරයි. එය පූර්ව-ප්‍රජාතාන්ත්‍රික සහ නිර්-ප්‍රජාතාන්ත්‍රික දේශපාලන මාදිලියකි.

**අභ්‍යාස**

1. රාජ්‍ය බලය බෙදීම පදනම්කරගෙන පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති , විධායක බලය සංවිධානය කිරීම අනුව පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති යන තේමා දෙක යටතේ විවාද කණ්ඩායම් දෙක බැගින් සූදානම් කර විවාදයක් සැලසුම් කරගන්න.

ClassWork.LK

ClassWork.LK